6 මට හැඟෙන අයුරින් සිකොලොජිය
rasikalogy.blogspot.com

# යුද්ධය උත්කර්ෂයට නැංවීම අවැඩකි 2015 වසරේ මතකයක්



පළමුවෙනි ලෝක යුද්ධයේ දී, එවකට මහා බ්‍රිතාන්‍යය ප්‍රමුඛ සංධානය වෙනුවෙන් යුද වැදුණු ඕස්ට්‍රේලියානු සහ නවසීලන්ත හමුදා බල ඇණි, තුර්කියේ ගැලිපොලි නම් ස්ථානයට කඩා වැදීම සිහිපත් කරන ඇන්සැක් දිනය (ANZAC Day) නම් වූ සැමරුම සෑම වසරක දී ම, අප්‍රියෙල් 25 දා ඕස්ට්‍රේලියාව පුරා නගරවලදී ද, තුර්කියේ පිහිටි ඒ ඓතිහාසික යුද බිමේදී ද පැවැත්වේ. මේ ඇන්සැක් දිනය ඕස්ට්‍රේලියාවේ නිවාඩු දිනයක් ද වේ. වර්ෂ 2015 දී පැවති මේ උත්සව මාලාව වැදගත් එකක් වූයේ, ඒ වසරේ දී, ගැලිපොලි සටනට හරියටම වසර සීයක් පිරීම නිසායි.

ඒ ගැලිපොලි ආක්‍රමණයේ අරමුණ වී ඇත්තේ කොන්ස්තන්තිනෝපල් නගරය යටත් කරගෙන, ජර්මනිය හා පැවතුණු යුද්ධයට තවත් ප්‍රහාරක මාර්ගයක් විවර කරගැනීමයි. නමුත්, මාස අටක් පුරා පැවති යුද්ධයෙන් පසු බ්‍රිතාන්‍ය පිලේ බල ඇණි පසු බැස තියෙන්නේ දෙපිරිසෙන් ම ලක්ෂයකට වඩා මිනිස් ජීවිතවල විනාශයත් සමගයි.

බ්‍රිතාන්‍ය කොලණි කිහිපයක් ලෙස වෙනම ආණ්ඩු කෙරුණු වත්මන් ඕස්ට්‍රේලියාවේ ප්‍රාන්ත එකතු කරමින් ඕස්ට්‍රේලියානු ෆෙඩරල් රජය බිහිවී ඇත්තේ වසර 1901 දී යි. ඒකීය රාජ්‍යයක් ලෙසින් ඕස්ට්‍රේලියාව මුලින්ම සහභාගී වූ ප්‍රධානතම යුද මෙහෙයුම ලෙසින් සැලකෙන මේ ගැලිපොලි සටන නිසා එක් රටක් ලෙස ජාතිමාමතවාදය යත්, අසල්වැසි නවසීලන්තය සමග එක පෙරමුණක යුධ වැදීම නිසා දෙරට අතර අන්‍යෝන්‍ය අවබෝධයකුත්, ඇති වුණු බව සාමාන්‍ය පිළිගැනීමයි.

ඉන් පසු ඕස්ට්‍රේලියාව රටක් හැටියට, දෙවන ලෝක යුද්ධයට සහභාගී වූ බව අපි දනිමු. ඒ බ්‍රිතාන්‍යයේ මූලිකත්වය තිබූ මිත්‍ර පාර්ශවයේ කොටස්කරුවෙකු ලෙස ය දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු ඇමරිකා එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියාව අතර යුද කටයුතු සම්බන්ධයෙන් එකඟතාවක් ද ඇති වී තිබේ. ඕස්ට්‍රේලියාවට එවැනි ගිවිසුමක් වැදගත් වුනේ ජපානය වැනි රටක ආක්‍රමණයක් හමුවේ සහාය ලබා ගැනීම සඳහායි.

නමුත් මේ දක්වා ප්‍රායෝගිකව සිදුවී ඇත්තේ දෙවෙනි ලෝක යුද්ධයෙන් පසුව ඇතිවුණු කොරියන් යුද්ධය, වියට්නාම් යුද්ධය, ගල්ෆ් යුද්ධය, ඉරාක යුද්ධය, ඇෆ්ගනිස්ථාන් යුද්ධය වැනි ඇමරිකාව මූලිකත්වය ගත් යුද මෙහෙයුම්වලට සහභාගී වීමට ඕස්ට්‍රේලියාවට සිදුවීමයි.

වියට්නාම් යුද්ධයේ දී, එයට විරුද්ධව රට තුළ ඇති වුණු විරෝධය නිසා යුද්ධය සැමරීම කාලයක් තිස්සේ, ඕස්ට්‍රේලියාවේ ඉහළින් සිදු කෙරුණු දෙයක් වී නැත. නමුත් පසුකාලීනව සිදුවුණු ඉරාක යුද්ධය වැනි දේශපාලනික කරුණු මත සිදුවුණු යුද මැදිහත්වීම් නිසා, ඒ ගැන ඇතිවෙන විරෝධය එක් ආකාරයකට යටපත් කරන්නට දෝ, යුද කටයුතු සැමරීම සඳහා ඕස්ට්‍රේලියානු ආණ්ඩු මගින් කෙමෙන් කෙමෙන් වැඩිවෙන අවධානයක් යොමු කර ඇති බවයි පෙනෙන්නට තිබේ.

පළමු ලෝක යුද්ධයේ ගැලිපොලි සටනට වසර සියයක් සැමරුණු 2015 වසරේ එලෙස යුද්ධය උත්කර්ෂයට නැංවීම උපරිමව කෙරුණු බව හොඳින් පෙනුණි.

මෙහි සෘණාත්මක කූටප්‍රාප්තිය වුණේ, තම ට්විටර් ගිණුම හරහා යුද්ධයට සහ ඊනියා රණ විරුවන්ට දැඩි ලෙස සරදම් කෙරුණු සටහන් කිහිපයක් තමන්ගේ 30,000 ක පරිජනයාට බෙදා හැරි එස්බීඑස් රූපවාහිනී නාලිකාවේ මාධ්‍යවේදියෙකු සේවයෙන් පහ කිරීමයි.

එස්බීඑස් නාලිකාව රජයෙන් යම්කිසි ප්‍රමාණයක වාර්ෂික ආධාර ලබන, නමුත් වෙළඳ දැන්වීම් ප්‍රචාරය කිරීමෙන් මුදල් උපයන, ස්වාධීනව පවත්වාගෙන යන ආයතනයකි. එසේ වෙතත්, ඒ ට්විටර් පණිවිඩ ගැන ඕස්ට්‍රේලියානු ෆෙඩරල් රජයේ සන්නිවේදන ඇමති, අදාළ බලධාරීන්ට පැමිණිලි කළ බවත්, සේවයෙන් පහ කිරීම සිදුවුණේ ඉන් පසුව බවත් කියවේ.

විචාරකයින් බොහෝ දෙනෙකුගේ අදහස වූයේ මෙය හොඳ පෙර නිමිත්තක් නොවන බවයි. මගේ අදහස ද එයම ය. යුද්ධය යනු උත්කර්ෂයට නැංවිය යුතු දෙයක් නොවේ. රටක් යුද වැදිය යුත්තේ, එය නොකර සිටීම කළ නොහැකි ම නම් පමණයි.

## රසිකොලොජිස්ට්

එස්බීඑස් සේවයේ ක්‍රීඩා මාධ්‍යවේදී ස්කොට් මැකින්ටයර් ගේ සේවය 2015 දී අහිමි කළ ඒ ට්විටර් පණිවිඩ මෙසේ විය.

1. ඕස්ට්‍රේලියාව සමග කිසිදු ආරවුලක් නොතිබුණු විදේශික රටක් අධිරාජ්‍යවාදීන් ලෙස ආක්‍රමණය කිරීමේ ක්‍රියාව වන්දනාමාන කිරීම නූතන සමාජයේ ඇති සියලූම පරමාදර්ශයන්ට එරෙහිව යන්නකි.
2. පොතක් පත්තරයක් කියවා නැති, මුළුමනින්ම වාගේ සුදු හම ඇති, ජාතිකවාදී බේබද්දන් සහ සූදු අන්තුවන් පිරිස අද සමස්ත මිනිස් ප්‍රජාවටම මුහුණ දෙන්නට සිදුවුණු බිහිසුණු අත්දැකීම ගැන අද එක මොහොතක් හෝ නැවතී සිතා බලාවිද?
3. මේ අභීත ඇන්සැක් ලා ඊජිප්තුවේ දී, පලස්තීනයේ දී සහ ජපානයේ දී සිදු කළ නඩු නැති දිවි තොර කිරීම්, සැමතැනපතල ස්ත්‍රී දූෂණ සහ සොරකම් සිහිකරමු.
4. එක් දිනක් තුළ සිදුවුණු ඉතිහාසයේ විශාලතම ත්‍රස්තවාදී ප්‍රහාර සිදු කරන ලද්දේ මේ රට සහ ඔවුන්ගේ මිත්‍රපක්ෂ විසින් හිරෝෂිමාවේ දී සහ නාගසාකි හි දී බව අමතක නොකරමු.
5. පාසල් යමින් සිටි කුඩා දරුවන් මරා දමන ලදී. ඔවුන් ගේ සෙවනැලි හිරෝෂිමාවේ කොන්ක්‍රීට් තුලට කා වැදී ගියේය.

